# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1648/16 - 2010 අප්‍රේල් 10 වැනි සෙනසුරාදා - 2010.04.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### පාර්ලිමේන්තු මැතිවරණය - 2010

ඡන්ද විමසීම ශුන්‍ය කළ ඡන්ද මධ්‍යස්ථානවල අලුතින් ඡන්ද විමසීම පැවැත්වීම

2010 අප්‍රේල් මස 08 වැනි දින පවත්වන ලද පාර්ලිමේන්තු මැතිවරණයේ පහත උපලේඛනයේ සඳහන් ඡන්ද පොළ වල ඡන්ද විමසීම ශුන්‍යකළ බැවින්, 1988 අංක 35 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත මගින් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 48අ (7)(ආ) වගන්තිය අනුව, අලුතෙන් ඡන්ද විමසීම පැවැත්වීම, 2010 අප්‍රේල් මස 20 වැනි දින පෙ.ව. 7.00 සිට ප.ව. 4.00 දක්වා කාල වේලාව තුළ දී පහත උපලේඛනයේ III වැනි තීරයෙහි දැක්වෙන ඡන්ද පොළ වලදී පැවැත්වෙන බව මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක වන මම මෙයින් නිවේදනය කරමි.

එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ අපේක්ෂකයින්ගේ නම්, එම පක්ෂවල සහ ස්වාධීන කණ්ඩායම් වල එක් එක් අපේක්ෂකයාට පවරන ලද අනුක්‍රමික අංකය සහ එක් එක් දේශපාලන පක්ෂයට සහ ස්වාධීන කණ්ඩායමට වෙන් කරන ලද අනුමත ලකුණු සහ එක් එක් ස්වාධීන කණ්ඩායම සඳහා වෙන් කර දී ඇති හඳුනා ගැනීමේ අංකය ද 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 24 (1) වැනි වගන්තිය යටතේ 2010 මාර්තු මස 02 වැනි දින අංක 1943/87 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* දැන්වීමේ සඳහන් වූ ආකාරයට ය.

ඒ ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ නම සහ එක් එක් ස්වාධීන කණ්ඩායමේ හඳුනාගැනීමේ අංකය ඡන්ද පත්‍රිකාවේ මුද්‍රණය කරනු ලබන අනු පිළිවෙල, ඉහත සඳහන් ගැසට් පත්‍රයේ දැන්වීමේ ඇති අනුපිළිවෙල අනුව වේ.

මහනුවර සහ ත්‍රිකුණාමලය යන මැතිවරණ කොට්ඨාසවල තේරීම්භාර නිලධාරීන්, අදාළ ඡන්ද ප්‍රදේශවල පිහිටි ඡන්ද මධ්‍යස්ථානවල ඡන්ද විමසීම් පවත්වනු ඇත.

දයානන්ද දිශානායක,
මැතිවරණ කොමසාරිස්.

2010 අප්‍රේල් මස 10 වැනි දින,
රාජගිරිය,
සරණ මාවත,
මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ය.

1A - G 12698 — 830 (2010/04)

**උපලේඛනය**

| *I වැනි තීරය* | *II වැනි තීරය* | *III වැනි තීරය* | |
|---|---|---|---|
| *මැතිවරණ කොට්ඨාසය* | *ඡන්ද ප්‍රදේශය* | *ඡන්ද මධ්‍යස්ථානයේ නම* | |
| අංක 04 - මහනුවර | ක - නාවලපිටිය | 01 | දොලොස්බාගේ කණිෂ්ඨ විද්‍යාලය, ලෙව්දෙනිය |
| | | 02 | අලුගොල්ල කණිෂ්ඨ විද්‍යාලය, අලුගොල්ල |
| | | 03 | පටිතලාව කණිෂ්ඨ විද්‍යාලය, පටිතලාව |
| | | 05 | සේනාධිකාරි ජාතික පාසල, උඩහේන්තැන්න |
| | | 06 | ගැමුණුපුර කණිෂ්ඨ විද්‍යාලය, ගැමුණුපුර |
| | | 07 | යටපාන කණිෂ්ඨ විද්‍යාලය, ග්‍රේස්ලැන්ඩ් ජනපදය |
| | | 09 | ඉවල්ගොල්ල දෙමළ කණිෂ්ඨ විද්‍යාලය, ඉවල්ගොල්ල වත්ත |
| | | 11 | පැල්ලපිටිය කණිෂ්ඨ විද්‍යාලය, පැල්ලපිටිය - ශාලා අංක 1 |
| | | 12 | පැල්ලපිටිය කණිෂ්ඨ විද්‍යාලය, පැල්ලපිටිය - ශාලා අංක 2 |
| | | 13 | හල්දොල ග්‍රාම සංවර්ධන සමිති ශාලාව, හල්දොල |
| | | 14 | ගිරාඋල්ල මහා විද්‍යාලය, මීතලාව, ශාලා අංක 1 |
| | | 15 | තැලිහුන්න ජනපදය කණිෂ්ඨ විද්‍යාලය, තැලිහුන්න ජනපදය |
| | | 16 | ගිරාඋල්ල මහා විද්‍යාලය, මීතලාව - ශාලා අංක 2 |
| | | 17 | එම්. එස්. අලුත්ගමගේ මහා විද්‍යාලය, ගල්පාය |
| | | 18 | තැලිහුන්නගම කණිෂ්ඨ විද්‍යාලය, තැලිහුන්නගම |
| | | 20 | පේෂකර්ම මධ්‍යස්ථානය, හලාගම |
| | | 30 | මහ/ගලත කණිෂ්ඨ විද්‍යාලය, ගලත - ශාලා අංක 1 (පිරිමි) |
| | | | මහ/ගලත කණිෂ්ඨ විද්‍යාලය, ගලත - ශාලා අංක 2 (ගැහැණු) |
| | | 34 | පත්තුනුපිටිය මහා විද්‍යාලය, පත්තුනුපිටිය |
| | | 36 | වරකාව කණිෂ්ඨ විද්‍යාලය, ගෝනාවල පතන |
| | | 37 | නාවලපිටිය මධ්‍ය මහා විද්‍යාලය, බව්වාගම - ශාලා අංක 1 (පිරිමි) |
| | | | නාවලපිටිය මධ්‍ය මහා විද්‍යාලය, බව්වාගම - ශාලා අංක 2 (ගැහැණු) |
| | | 39 | කඩියන්ලෙන කණිෂ්ඨ විද්‍යාලය, කඩියන්ලෙන |
| | | 40 | බර්කේපල් වත්ත රජයේ විද්‍යාලය, වෙස්ට්හෝල් |
| | | 41 | වෙස්ට්හෝල් දෙමළ විද්‍යාලය, වෙස්ට්හෝල් |
| | | 42 | හෛඩ්‍රි කණිෂ්ඨ විද්‍යාලය, රොසැල්ල |
| | | 43 | ටෙම්පල්ස්ටෝව් දෙමළ විද්‍යාලය, ටෙම්පල්ස්ටෝව් වත්ත |
| | | 44 | මීපිටිය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, මීපිටිය |
| | | 46 | රඹුක්පිටිය මහා විද්‍යාලය, පහල රඹුක්පිටිය |
| | | 47 | අලුත්ගම ජනපදයේ ධර්මරාජ විහාරස්ථානයේ ධර්ම ශාලාව, අලුත්ගම ජනපදය |
| | | 48 | ශ්‍රී ධම්මරතන විද්‍යාලය, දෙකිඳ |
| | | 49 | ගලබොඩ දෙමළ මහා විද්‍යාලය, ගලබොඩ |
| | | 50 | ඉඟුරුඔය කණිෂ්ඨ විද්‍යාලය, ඉඟුරුඔය ජනපදය |
| | | 54 | කදිරේෂන් කුමාර මහා විද්‍යාලය, කොත්මලේ පාර |
| | | 56 | අනුරුද්ධ කුමාර මහා විද්‍යාලය, අඹගමුව පාර |
| | | 57 | නාවලපිටිය කණිෂ්ඨ බාලිකා විද්‍යාලය, සොයිසාකැලේ - ශාලා අංක 1 (පිරිමි) |
| | | | නාවලපිටිය කණිෂ්ඨ බාලිකා විද්‍යාලය, සොයිසාකැලේ - ශාලා අංක 2 (ගැහැණු) |
| අංක 14 - ත්‍රිකුණාමලය | ආ - ත්‍රිකුණාමලය | 78 | පෙර පාසල් ගොඩනැගිල්ල, බර්කා හන්දිය, කුඹුරුපිටිය. |

04-619

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.